# මියුසියස් විද්‍යාලය

අධ්‍යයන ලිපි ගොනුව 2 /දෙවන සතිය/2020 මාර්තු

ශ්‍රේණිය: 08 විෂය: සිංහල මාධ්‍යය: සිංහල

## පාඩම 01

### <u>තද්ධිත</u>

- නාම ප්‍රකෘතියකට ප්‍රත්‍යය එක් වීමෙන් සැදෙන අන්‍ය නාම මෙනමින් හැඳින්වේ.
- උදා: **මය,මත්,වත්,මුවා,තර,තම,තා,ඉ,ඉති,ඉක,ආණ,අණු,අණි,අටු,ඊය,අටි** ආදිය වේ.

**උදා; ගුණ + වත් = ගුණවත්**
**රන් + මුවා = රන්මුවා**

හිස්තැන් වලට සුදුසු **තද්ධිත** නාම පදය යොදන්න.

1.දිළිඳු ජනතාව ගේ ( ) සොයා බලා ඔවුන්ට පිහිට වීම ඉතා වැදගත් ය.
2.පොත්පත් වල පලවෙන ( ) පින්තූර වලට බොහෝ පාඨකයෝ කැමති වෙති.
3.මහාචාර්යතුමා අමතන විට එහි පැවතියේ ( ) කි.
4.මැණියෝ ළදරුවාගේ ( ) සිරුර සිප ගත්හ.
5.කොකා දිය ( ) වල පිහිනන මාළුවන් ඇල්ලීමට මාන බලයි.

**(නිහැඬියාවකි,කඩිති,වර්ණවත්,අවශ්‍යතා,මොළකැටි)**

Musaeus College

පහත වචන වල **නාම ප්‍රකෘති** වලට ගැළපෙන **ප්‍රත්‍යය** යොදන්න.

1.සිරි+......
2.පින්+......
3.ගීත+......
4.ස්වර්ණ+......
5.රිදී+......
6.රස+......
7.විශාල+......
8.රත්න+......
9.ඉසුරු+......
10.රූ+......

---

# පාඩම 02

## <u>කෙටි කතා</u>

- "අවුරුදු සිහිනය" නම් පාඩමට අනුව අපිත් කෙටි කතාවක් ගොඩනගමු.

කෙටි කතාවක ඇත්තේ ප්‍රධාන සිද්ධි එකකි. කෙටි කතාවක සිද්ධි වල හා අවස්ථා වල මනා සම්බන්ධයක් ඇත. චරිත එකක් හෝ දෙකක් ප්‍රධාන වේ. කෙටි කාලයකින් සිදුවීම් කීපයක් කියැවෙන කෙටි වූ කතාවකි.

කැමති මාතෘකාවකට අදාළව ඔබත් කෙටි කතාවක් ලියා එයට අදාළ චිත්‍රයක් ද අඳින්න.



Musaeus College

# පාඩම 03

## <u>තනි පද</u>

පද කීපයක් තනි පදයකින් දැන්වීම මෙහිදී සිදුවේ.

නිවැරදි තනි පදය තෝරා ලියන්න.

1.තුන් පැත්තකින් මුහුදෙන් වටවූ (      )
2.කළගුණ නොදන්නා (      )
3.තම මතයට අනුව ක්‍රියා කරන (      )
4.කිසිම ප්‍රයෝජනයකට නොමැති (      )
5.කිසිම අර්ථයකට නොමැති (      )
6.එකම කාලයකට අයත් (      )
7.පෙර තිබූ තත්වයට සකස් කිරීම (      )
8.වැරදි දෘෂ්ටි දරන්නෝ (      )
9.ගෞරවය ලැබීමට සුදුසු (      )
10.ගලින් කරන ලද (      )

(සමකාලීන, ශෛලමය, නිරර්ථක, නිෂ්ප්‍රයෝජන, ප්‍රතිසංස්කරණ, ගෞරවාර්හ, ප්‍රතිවක්‍රීකරණය, අත්තනෝමතික, ගුණමකු, මිථ්‍යාදෘෂ්ටිකයෝ, අර්ධද්වීපය)

Musaeus College

## පාඩම 04

**<u>දැන්වීම් පත්‍ර</u>**

ප්‍රබල ප්‍රචාරණ උපක්‍රමයක් ලෙස ආර්ථීක, සමාජීය, සංස්කෘතික ආදී කවර ක්ෂේත්‍රයකට අදාළව වුවද ප්‍රජාව දැනුවත් කිරීමට මෙය භාවිතා වේ.

මෙහිදී නිරවුල් සන්නිවේදනයක් අවශ්‍යයි. කරුණු නිවැරදි විය යුතුයි. සංක්ෂිප්ත විය යුතුයි. ආකර්ෂණීය බව හා සරල බව අවශ්‍යයි.

ඔබත් මේ දින වල පවතින “නව කොරෝනා” වෛරසය හේතුවෙන් ඉන් වැළකීමට සමාජ ප්‍රජාව දැනුවත් කරන අන්දම හා පිළිපැදිය යුතු සෞඛ්‍ය පුරුදු, ඉන් වැළකීමට ගත හැකි පියවර ආදී දේ සඳහන් කරමින් සමාජ සුබ සිද්ධියට අදාළ වන සේ දැන්වීම් පත්‍රිකාවක් සකසන්න.

---

## පාඩම 05

**<u>රචනා</u>**

“වර්තමාන තාක්ෂණයේ දියුණුව සමාජයට බලපාන අයුරු” යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

**සැකසුම: සජීවා ලියනගේ**

Musaeus College